# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2359/37 – 2023 නොවැම්බර් මස 23 වැනි බ්‍රහස්පතින්දා – 2023.11.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2020/237.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2350/41 දරන හා 2023.09.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත්කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් කහතුඩුව, ප්‍රගති මාවත, අංක 421/සී/17 හි පදිංචි ඩබ්. කේ. ඒ. ඉන්දුමතී මිය ඇතුළු සේවක පිරිස සහ අනෙක් පාර්ශ්වය වශයෙන් බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234 හි පිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 58/2022 දරන හා 2023.08.31 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 58/2022 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2024.09.20 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 07 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,
අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත,
බත්තරමුල්ල.
2023.10.23

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2023.09.20 දිනැති අංක 2350/41 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද ඩබ්. කේ. ඒ. ඉන්දුමතී මිය ඇතුළු සේවක පිරිස සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය බැඳී සිටින්නා වූ ද 2023.08.31 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

ජේ. එම්. ආර්. යූ. ජයසිංහ,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී,
පරිපාලන හා මානව සම්පත්,
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,
කොස්වත්ත,
බත්තරමුල්ල.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින.

පිටපත : ඩබ්. කේ. ඒ. ඉන්දුමතී.
(අනෙක් පාර්ශ්වය)

(1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න).

(2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවායෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 11 - 0259

මගේ අංකය: IR/COM/03/2019/191.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2344/13 දරන 2023.08.07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත්කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් මතුගම, මහ කළුපහන, ලිහිණියාව හි පදිංචි කේ. කේ. ඩබ්. ආර්. කාරියවසම් මයා සහ කොළඹ 03, ගාලු පාර, අංක 411, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල හි පිහිටි ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 10/2023 දරන හා 2023.07.01 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 10/2023 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2024.08.07 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්,
අංක 411, E. H. කුරේ ගොඩනැගිල්ල, ගාලුපාර,
කොළඹ 03.
2023.10.26

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2023.08.07 දිනැති අංක 2344/13 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද කේ. කේ. ඩබ්. ආර්. කාරියවසම් මයා සහ ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් බැඳී සිටින්නා වූ ද 2023.07.01 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

**කේ. ඒ. එස්. එල්. කුරුප්පු ආරච්චි,**
නීතිඥ, ප්‍රසිද්ධ නොතාරිස්
දිවුරුම් කොමසාරිස් සහ සමාගම් ලේකම්,
කළමනාකරු - නීති හා පරිපාලන,
සී/ස, ලංකා විදුලි (පෞද්.) සමාගම,
ප්‍ර.කො., අංක 411, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල,
කොළඹ 03.

පිටපත : (අනෙක් පාර්ශ්වය) කේ. කේ. ඩබ්. ආර්. කාරියවසම්, ලිහිණියාව, මහ කළුපහන, මතුගම. (ලි.ප.තැ. මගින් යොමු කරන ලදී.)

(1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න).

(2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවායෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 11 - 0260

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.